# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/16 - 2013 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2013.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් හා 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීම.

පනතේ 29 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද යම් කෘෂි කාර්මික ඉඩමක් හෝ ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම ඉඩම හෝ ඉඩම් සම්බන්ධයෙන් සම්බන්ධතාවයක් දැරූ සෑම තැනැත්තෙකුම, වර්ෂ 2013.04.01 දින සිට මසක් ඇතුලත එම ඉඩම සම්බන්ධයෙන් එම පනත යටතේ ගෙවිය යුතු මුළු වන්දිය හෝ ඉන් කොටසක් සඳහා තෙපිටපතකින් යුතු ලිඛිත හිමිකම් පෑමක්ද ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරන අතර, එම හිමිකම් පෑමෙහි පහත සඳහන් විස්තර දැක්විය යුතු යැයි නියම කරමි.

(අ) හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය :-
(ආ) එම ඉඩමෙහිලා ඔහුගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය :-
(ඇ) ඔහුගේ හිමිකම් පෑමෙහි විස්තර ; සහ
(ඈ) ඒ වන්දියෙන් ඔහු හිමිකම්පාන ප්‍රමාණය

සියළු හිමිකම් පෑමක්ම ලියා පදිංචි තැපෑලෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කල යුතු බව දන්වනු කැමැත්තෙමි.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2013 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු අංකය | විශේෂ්‍ය අංකය | ප්‍රකාශකගේ නම | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ගම | පැවරෙන ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | කො/3399 | ඕඩ්රි එව්ලින් ලොයිස් පීරිස් මෙනවිය | කිතුල් කන්ද | ගම්පහ | කිරිකිත්ත | 90 | 0 | 00 |
| 02 | කො/3439 | ගර්ටි අයරින් අබේවික්‍රම නොහොත් ගර්ටි අයරින් ගමගේ | හෝමදොල මූකලාන හෙවත් කන්නැලිය වත්ත | ගාල්ල | උඩුගම | 45 | 0 | 00 |

03 - 655/1

1A - G 17354 — 365 (2013/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## සංශෝධනය

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වෙනි වගන්තිය යටතේ පළ කරන ලද ගැසට් නිවේදනය සංශෝධනය කිරීම.

2012.03.06 දින අංක 1748/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් උප ලේඛනයේ දැක්වෙන කො/1911 යටතේ පළ කරන ලද දැන්වීම ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් දැන්වීම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

උපලේඛනය

| ඉ.ප්‍ර.කො. සභාවේ විශේෂ්‍ය අංකය | ප්‍රකාශකගේ නම | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ගම | ඉ.ප්‍ර.කො. සභාවට පැවරෙන ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අ. | රූ. | පර්. |
| කො/1911 | පිරාමනසිංහගේ ජුවන් ෆොන්සේකා මයා | මරික්කාර් තෝට්ටම් | පුත්තලම | කන්ද කුඩාව | 7 | 2 | 18 |

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2013 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

03 - 655/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.